# "නුඹේ සිරික්කිය" අර්ථවත් වන්නට නම්

සිසිර දිසානායකගේ "නුඹේ සිරික්කියට" ගීත එකතුව පසුගියදා නිකුත්විය. ඊට ප්‍රථම ඔහුගේ ගේය පද ඇතුළත් "සිසිර ගේ කුරුටු ගී" කෘතිය අප අතට පත්වී තිබුණි. සුරස ගී අසනු රසි සහෘදයනට මෙය ඔවුන්ගේ අමන්දානන්දයට හේතු වෙතැයි මම සිතමි. එහෙත් සිසිරගේ මෙම නිර්මාණාත්මක වෑයම පිළිබඳ විද්වත් විචාරක අවධානයකට පාත්‍ර නොවීම කණගාටුවට කරුණකි. පොත මුද්‍රණයේදී ඊට ආරාධිත විද්වතෙකුගෙන් සපයා ගන්නා විචාර සටහන හැරුණු විට ඉන් පරිබාහිරව එම නිර්මාණ පිළිබඳ සැළකිය යුතු කතිකාවක් විෂය බද්ධ විද්වතුන් අතින් සිදු නොවීම අඩුවක්මය. *අදාල කෘතියට ආරාධිත සටහන සම්පාදනය කරන විද්වතුන් පවා මෙකල එහි ප්‍රබලතා මිස දුබලතා විවිරණය නොකොට නිර්මාණකරුගේ හිත නොරිදවන්නට වගබලා ගනිති. එබැවින් නිර්මාණකරුට තම නිර්මාණ පිළිබඳ සමබර සංවර්ධනාත්මක විචාරයක් ලබා ගැනීමට ඇති මං ඇහිරී තිබේ. ඇතැම් විට එම වරදේ එක් පසෙක නිර්මාණකරුද නැත්තේ නොවේ. මන්ද සමහර විටෙක කෘතියේ දුබලතා මතුකිරීම නිර්මාණකරු නොයිවසන බැවිනි. එම තත්වය නිරවද්‍ය සමබර විචාරයක් තම නිර්මාණය වෙත ගලා ඒම වලක්වනු ලබයි. ඇතැම් කල්හි සාවද්‍ය අශාස්ත්‍රීය විචාරද නැත්තේ නොවේ. තම හිතවතකු නිර්මාණයක් කළ විට එය අනර්ඝ වන්නේත් තම ප්‍රතිවිරුද්ධ පාර්ශවයේ යයි තමාට හැඟෙන නිර්මාණකරුවෙකු නිර්මාණයක් කළවිට එයට බැට දෙන්නේත් මේ අවිචාරවත් විචාරවත නිසාවෙනි. නිර්මාණකරුගේ නම, ගම, කුලගොත, තනතුර හා හිතමිතුරු ඥාති සම්බන්ධතා ආදී බාහිර සාධක විචාරයේදී මුලට පැමිණෙද එය එතැන් සිට විචාරයක් නොව ප්‍රශස්තියක්මය. එමගින් නිර්මාණකරුට හෝ පාඨක සමාජයට සිදුවන මෙහෙයක් නැත. ඇතැම් විට නිර්මාණකරුට "සිවිල් පොරක්" ලෙස ඊක කලක් වැජඹිය හැකි වුවද සැබෑ නිර්මාණකරුවකු ලෙස දිගු කාලීන කීර්තියක් ඔහු වෙත නො පැමිණේ. මිනිස් ඝාතකයකුට වුවද ළංකර ගතහැකි ප්‍රසිද්ධිය පමණක් ඔහු වෙත රැඳී පවතී. එබැවින් කීර්තිධර නිර්මාණකරුවකු සහෘද සමාජය තුළ පහලවන්නේ නිර්මාණ හරහා මිස ඉන් වියුක්ත වූ බාහිර සාදක මත නොවේ.*

*සිසිර දිසානායක ඇතුලු නූතන ගීත රචක පරපුර හමුවේ ඇති අභියෝග අතර මෙම විචාර කලාවේ අර්බුදයද සුළු පටු නොවේ. එවකට පැවති එකම රජයේ ගුවන් විදුලිය සේකරලාට, සුනිල් ආරියරත්නලාට, රත්න ශ්‍රීලාට ගීත රචකයින් සේ වැඩෙන්නට ලබාදුන් ඉඩකඩ අද ගුවන් විදුලි සේවාවන් 30කට අධිකව පැවතියද නොලැබීම කවර අවාසනාවක්ද? ගීත ප්‍රචාරයේදී රචකයාගේ නම හැර නිවසේ වෙසෙන සුනඛයාගේ නම මතක් කරන්නටත් ගුවන් කාලය වැය කරන නිවේදක මල්ලිලා ගැන අමුතුවෙන් කිවයුතු නැතැයි සිතමි.*

සිසිරගේ ගී මග මූලික ලෙස ජන කවිය හා ජනශ්‍රැතික වටපිටාව හරහා වැටී ඇතැයි සිතීම අසාධාරණ නොවේ. මන්ද ඔහුගේ ගී එපමණටම ජනකවිය ගැමි වහර හා ගැමි ජීවිතය පිළිබඳ කේන්ද්‍රීය නාදකමකින් බැඳී ඇති අයුරක් ප්‍රකට වන බැවිනි.

ඔහුගේ එම ගීතාවලියේ අපට හමුවන වසන්තා මධුරංගනී ගයන 'සඳ සාවී මා' හා දීපිකා ප්‍රියදර්ශනිය ගයන 'බැද්දේගමේ ගිය මද්දුමයෝ' යන ගීත දෙක වඩාත් ප්‍රසස්ට ගීත දෙක බව මගේ හැඟීමයි. ජන කවියෙන් හොයාගත් භාෂාව, ආකෘතික ලක්ෂණ හා රිද්ම ලක්ෂණ මනුෂ්‍ය ජීවිතයේ අති සංවේදී අත්දැකීම් සංජානනය කරනු වස් වඩා නිර්මාණාත්මක ලෙස යොදාගෙන ඇත්තේ මෙම ගීත දෙක තුළය. ජනශ්‍රැතික පරිසරය හා රිද්ම ලක්ෂණ ඇසුරු කළ පමණින් සැම විටම ගීතයක් සාර්ථකත්වයට ලඟා නොවේ. නිර්මාණකරුවා කවර හෝ මූලාශ්‍රයකින් ලබන අභාසය අප ජීවන අනුභූතීන් කලාත්මක ඇසකින් ප්‍රතිනිර්මාණය කරන්නට සමත් වෙතොත් පමණක් සාර්ථක ප්‍රතිඵල ලැබුයේ වෙයි. සිසිරගේ උක්ත ගීත දෙක අපගේ පැසසුමට පාත්‍ර වන්නේ ඒ අරුතිනි. එම ගීත දෙකට අමතරව සිසිරගේ ගීතාවලිය තුළ අපට හමුවන 'නුඹේ සිරික්කියට, හාද වෙන්නට ආව තමයි, ආලිස්සන් කතා බහට, ඉසුරුමුණියක කියා මා වැනි ප්‍රේමය හා ඒ ආශ්‍රිත මනෝභාවයන් කැටිකරගත් ගීත සිංහල ගීත සාහිත්‍යයේ අප පෙර රසවිඳ ඇති නිර්මාණ හා සැසඳීමේදී සුවිශේෂ ගී ලක්ෂණකින් පොහොසත් නොවේ. එහෙත් ඒවා සර්ව අසාර්ථක ගී ලෙස ඉවත දැමිය හැකි නොවන අතර අද ඇසන නිසරු ගී අතර එම ගී අප ප්‍රමෝදයට පත් කරනු ලබයි. *සිසිර පර්යේෂණශීලී භාෂා ප්‍රයෝග හේතුවෙන් කැපී පෙනෙන 'නුඹෙ සිරික්කියට ගීතය භාෂා ප්‍රයෝග නිසාවෙන්ම සතුටුවිය හැකි නොවේ. එම බස සැබවින්ම ගීතයට විචිත්‍රත්වයක් හා අපූර්ව ශබ්ද මාධුර්යක් ප්‍රදානය කොට තිබේ. එහෙත් ප්‍රේමය පිළිබඳ පාඨකයාගේ වින්දනය නැවුම් දිශාවකට කැඳවාගෙන යන සාරවත් අරුතකින් ගීතය සැරසී නොමැත. භාෂා ප්‍රයෝග හමුවේ සිසිරගේ පරිකල්පනය සිරවී ඇති බව මම සිතමි. එය එසේ නොවූයේ නම් මීට වඩා ප්‍රශස්ට ගීතයක් සිංහල ගීතයට එක්වන්නට ඉඩ තිබුණි.*

ගීත රචකයෙකු භාෂාවේ හා රිද්මයේ වහලෙකු විය යුතු නොවේ. තම අනුභූතිය වඩා හොඳින් ඉදිරිපත් කළ හැකි බසක් හා රිද්මය සමග ගනුදෙනු කිරීම වඩා වැදගත් වේ. රත්න ශ්‍රී යනු සිංහල ගීත ශබ්දකෝෂයට නැවුම් යෙදුම් රාශියක් එක්කළ රචකයෙකි. ඔහු රචිත, "අජානේය ඉස්කූටර්" ගීතයේ "ස්කූටර" ශාන්තිනී තේමාවටයි ගීතයේ එන "හඬන චන්දිරන්", බිම්බරක් සෙනඟ ගීතයේ එන "ටැක්ටරේ යකඩ ගජසෙන්", නිර්මලා ලොන්ඩ්‍රිය හිමි ගීතයේ "ලොන්ඩ්‍රිය" අල්ලට ශිල්ප සිඟා ගීතයේ 'කොම්පියුටර් නොදැනේ' වැනි නැවුම් වදන් හුදෙක් භාෂාමය නැවුම් බව පමණක් කැටිකර ගත් අවස්ථා නොවේ. ඒ හැම විටකම අතිශය නැවුම් පරිකල්පනයකින් ඔහු වඩා ගැඹුරු අරුතක් අප වෙත ප්‍රධානය කොට තිබේ. ඔහු ගේය පද රචකයෙකු ලෙස සාර්ථක වන්නේ අර්ථ ය මූලකොට ගෙන සිටින බැවිනි. සංගීතඥයා තනු නිර්මාණයට මෙහෙය වන්නේද අර්ථය විසිනැයි මම සිතමි.

*සිසිරගේ සංගීත තැටියත් ගී පද සංග්‍රහයත් ගෙන බැලූ විට ඇතැම් ගේය පද අපතේ ගියාදෝයි මට සිතේ. මන්ද ඊට සරිලන සංගීතය හෝ හඬ එක්තැන් නොවීම එම ගීත සදාකාලික නිහඬතාවයක රඳවා ඇති බැවිනි. සිසිර ඉතා වේගයෙන් ගීත රචනා කරන බව පෙනේ. වේගයෙහි ගැටලුවක් නැත. එහෙත් එම වේගය විසින් නිර්මාණයේ ගුණාත්මක බව ඉන් ඈත් වන්නේ නම් එය සැළකිය යුතු ගැටළුවකි.*

**සිසිර පර්යේෂණශීලී භාෂා ප්‍රයෝග හේතුවෙන් කැපී පෙනෙන 'නුඹෙ සිරික්කියට ගීතය භාෂා ප්‍රයෝග නිසාවෙන්ම සතුටුවිය හැකි නොවේ. එම බස සැබවින්ම ගීතයට විචිත්‍රත්වයක් හා අපූර්ව ශබ්ද මාධුර්යක් ප්‍රදානය කොට තිබේ. එහෙත් ප්‍රේමය පිළිබඳ පාඨකයාගේ වින්දනය නැවුම් දිශාවකට කැඳවාගෙන යන සාරවත් අරුතකින් ගීතය සැරසී නොමැත. භාෂා ප්‍රයෝග හමුවේ සිසිරගේ පරිකල්පනය සිරවී ඇති බව මම සිතමි. එය එසේ නොවූයේ නම් මීට වඩා ප්‍රශස්ට ගීතයක් සිංහල ගීතයට එක්වන්නට ඉඩ තිබුණි.**

සිසිරගේ "එම හදිසිය" ඔහුගේ ගී මගට අහිතකර ලෙස බලපා ඇතැයි මට සිතේ. මන්ද ප්‍රමාණාත්මකව ඇති ගීත සංඛ්‍යාවට සාපේක්ෂව ගුණාත්මක බවින් ඉහළ ගීත ඉතා අල්ප බැවිනි. ගීත සියයක් රචනා කරනවාට වඩා සතුටුවිය හැටි මට්ටමේ ගීත 25ක් රචනා කිරීම වඩා වැදගත් බව මම සිතමි. ඊට දැඩි ඉවසීමක් හා අභ්‍යාස කාලයක් අවශ්‍යවේ. එම ස්වයං විනය වර්ධනය කරගැනීමට සිසිර සමත්වන තරමට සිසිරගේ ඉදිරි නිර්මාණ සාර්ථක වනු ඇති බව මගේ හැඟීමයි. ගීත ලිවිය නොහැක. ලියැවිය යුතුය. තම අද්දැකීම සිත තුළ ගෙවන කළල අවධිය මෝරා ඇත්තේ නම් එය රචකයා අත වඩා නිරෝගී ගී උපතක් බවට පත්වේ. ඊට සුදුසු බස හා ආකෘතිය අනුභූතිය විසින් ජනිත කරනු ලබයි. මෝරා නොවැඩුනු අද්දැකීම් රිද්මගත වචනවල එල්ලීමෙන් පමණක් සාර්ථක ගීත නිර්මාණය නොවේ. එහෙත් ඇතැම්විට සුරස තනුවකින් මාධුර්යපූර්ණ විය හැකිය. එහෙත් අර්ථපූර්ණ නොවේ.

සාර්ථක නිර්මාණයක් කළ පසු රසිකයාට ඒ පිළිබඳව කතාවට ඉඩ සලසා නිර්මාණකරුවා නිහඬව සිටීම අප පිළිගත් සම්ප්‍රදායක් වෙයි. නිර්මාණකරුවකු කථා කරනුයේ නිර්මාණය තුළින් පමණි. එතැන් සිට කථාකරනුයේ රසිකයන් හා විචාරකයින් පමණි. ඔවුන් යමක් විමසා සිටියහොත් පමණක් ඒ පිළිබඳ තම මතය ප්‍රකාශ කිරීම හැර නිර්මාණකරුවෙකුට වෙනත් කථාවක් තිබිය නොහැකිය. තම නිර්මාණකරණයේදී සිසිර එම කරුණ පිළිබඳව අවධානය යොමුකරන්නේ නම් එය ඔහුගේම නිර්මාණ ජීවිතය කීර්තිමත් කරගනුවස් බෙහෙවින් ඉවහල් වන බව අවසන් වශයෙන් ලියාතබමි.

රවි සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com

**අදාල කෘතියට ආරාධිත සටහන සම්පාදනය කරන විද්වතුන් පවා මෙකල එහි ප්‍රබලතා මිස දුබලතා විවිරණය නොකොට නිර්මාණකරුගේ හිත නොරිදවන්නට වගබලා ගනිති. එබැවින් නිර්මාණකරුට තම නිර්මාණ පිළිබඳ සමබර සංවර්ධනාත්මක විචාරයක් ලබා ගැනීමට ඇති මං ඇහිරී තිබේ. ඇතැම් විට එම වරදේ එක් පසෙක නිර්මාණකරුද නැත්තේ නොවේ. මන්ද සමහර විටෙක කෘතියේ දුබලතා මතුකිරීම නිර්මාණකරු නොයිවසන බැවිනි. එම තත්වය නිරවද්‍ය සමබර විචාරයක් තම නිර්මාණය වෙත ගලා ඒම වලක්වනු ලබයි.**

## වික්ටෝරියානු භාෂා පාසලේ ප්‍රජා අංශයේ පළමු තැන සිංහල ගුරුතුමියකට

*විපුලී ගුණසේකර ගුරුතුමිය ප්‍රජා සම්මාන අංශයේ වසරේ හොඳම ගුරුතුමිය වශයෙන් සම්මාන ලබයි*

වික්ටෝරියානු භාෂා පාසලේ වාර්ෂික සම්මාන උළෙලේදී රොක්ස්බර්ග්පාක් සිංහල පාසලේ විපුලි ගුණසේකර ගුරුතුමිය ප්‍රජා සම්මාන අංශයේ වසරේ හොඳම ගුරුතුමිය වශයෙන් සම්මානයට පාත්‍රවූවා ය.

රොක්ස්බර්ග්පාක් සිංහල පාසලේ දිගු කලක් සේවය කර ඇති විපුලි ගුණසේකර මහත්මිය එහි විසිවිජ පන්ති බාර ගුරුතුමිය වශයෙන් තම පෞද්ගලික කාලය පවා වැය කරමින් කරන කැපවීම අගය කරමින් මෙම සම්මානය ප්‍රදානය කෙරුණි. පසුගිය වසර 4 තිස්සේ සිංහල විෂය සඳහා මෙම මධ්‍යස්ථානයෙන් පෙනී සිටි දරුවන් ඉහළම ලකුණු ලබා ගැනීම එම ගුරුතුමියගෙන් සිංහල පාසලේත් ගෞරවයට හේතු වී ඇත.

ශ්‍රී ලාංකික දරු දරියනගේ සිංහල භාෂා කුසලතා වර්ධනය කිරීමෙහි ලා ඇප කැප වී සිටින සියලුම ගුරු මහත්ම මහත්මීන්ට සන්නසේ ගෞරවාදරය හිමිවෙයි.

විපුලි ගුණසේකර මහත්මිය වික්ටෝරියානු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කතානායක ගරු හැරී ජෙන්කින්ස් මහතා අතින් සම්මානය ලබාගන්නා අවස්තාව සේයාරූවේ දැක්වෙයි.